විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/උපදෙස් ලිපි අංක 5/2016
ඔබේ අංකය / உமது இல. / Your No. } ........................
දිනය / திகதி / Date } 2016.05.30

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ත්‍රිවිධ හමුදාපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## වයස අවුරුදු 45 ට පසුව ලබා දුන් පත්වීම් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.

රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී උපරිම වයස් සීමාව අභිභවා පත්වීම් ලබා දීම, විශ්‍රාම ගැන්වීම සඳහා මාස 120 සම්පූර්ණ වී නොතිබීම, පරිවාස කාලයේ දී විශ්‍රාම ගැන්වීම යනාදි තත්ත්වයන් තුළ සිටින රාජ්‍ය නිලධාරීන් හට විශ්‍රාම වැටුප් සැකසීම සඳහා අදාළ අයදුම්පත්‍ර විශාල වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙමින් පවතින අතර ඔවුන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම ගැටලු සහගත වී ඇත. එසේම මෙම ගැටලු සම්බන්ධයෙන් ආයතන නිරන්තර විමසීම් කරනු ලබන බැවින් උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කරන ලද අතර එහිදී ලබා දුන් පැහැදිලි කිරීම් ඔබගේ විශේෂ අවධානයට යොමු කරමි.

(අ). රාජ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා වන උපරිම වයස් සීමාව අවුරුදු 45ක් විය යුතු බවට රජය තීරණය කර ඇති අතර එම සීමාව වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන් ආදී වෘත්තීය ශ්‍රේණී වලට බඳවා ගැනීමේ දී බල නොපාන බවත්, 1994.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 23/94 න් දැනුම් දී ඇති බැවින් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් නොමැතිව පත්වීමක් ලබා දී තිබේ නම් එය විධිමත් පත්වීමක් ලෙස පිළිගත නොහැකි බව.

(ආ). 2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21 / 2006 මඟින් ස්ථිර පත්වීම් ලබා දෙන අවස්ථාවේ දී අදාළ නිලධාරීන්ගේ වයස 2006.11.01 දිනට අවු. 45 ඉක්මවා තිබුණ ද ඔවුන් තාවකාලික , අනියම් , ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා අවස්ථාවේ දී වයස අවු.45 සම්පූර්ණ කර නොතිබුණේ නම් ස්ථිර පත්වීම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බව.

(ඇ). 2012 වර්ෂයේ උපාධිධාරීන් බඳවා ගැනීමේ දී වයස අවු.45 ඉක්ම වූ අයට ස්ථිර පත්වීම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බව.

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo-10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

(ඇ). 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 මගින් ද වයස් ඉක්ම වූ සේවකයන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීම. (චක්‍රලේඛයේ වයස සඳහන්ව නැත.)

(ඉ). රාජ්‍ය සේවයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ අමාත්‍ය මණ්ඩලය විසින් බැවින් එහි තීරණ නොසලකා කටයුතු කර කිසියම් රාජ්‍ය ආයතනයක් වයස අවු.45 ඉක්මවූවන් සඳහා පත්වීම් ලබා දීම නොවැළැක්විය හේතුවක් නිසා සිදු කර ඇත්නම් ඒ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතිය අමාත්‍ය මණ්ඩලය වෙතින්ම ගත යුතු බව.

(ඊ). වයස අවු 45ට වැඩි පත්වීම් බහුතරයක් ලබා දී ඇත්තේ කනිෂ්ඨ මට්ටමේ තනතුරු දරන්නන් සඳහා වන බැවින් එම පත්වීම් ලබා දුන් තැනැත්තන් ඒ සඳහා වගකිව යුතු බව.

02.උපරිම වයස් සීමාව ඉක්මවා යම් තැනැත්තෙකුට පත්වීමක් ලබා දී තිබේ නම් එය විධිමත් පත්වීමක් ලෙස පිළිගත නොහැකි බැවින් එවැනි පත්වීම් නීත්‍යානුකූල කිරීම තුළින් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව නිවැරදිව කටයුතු කළ පත්කිරීම් බලධරයන්ට මෙන්ම එම පත්කිරීම් බලධරයන්ගේ තීරණයට අනුව තම සේවය අවසන් වී රැකියා විරහිතභාවයට පත් වූ තැනැත්තන් හට බරපතල අගතියක් සිදු වන අතර එසේ නීතියට පරිබාහිරව පත්වීම් ලබා දීම තවදුරටත් සිදු කිරීමට ද එය පිටිවහලක් වන බව ද පෙන්වා දී ඇත.

03.එබැවින් වයස අවු.45ට පසු පත්වීම් ලබා දුන් රාජ්‍ය නිලධාරීන්ට අදාළ **ඉහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කර සුදුසු පරිදි කටයුතු කර, මාවෙත දැනුම් දුන් පසුව, රාජ්‍ය සේවය උදෙසා තම ශ්‍රමය කැප කළ රාජ්‍ය නිලධාරීන්ට කිසිදු ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවීම කටයුතු කළ හැකි බව** කාරුණිකව දන්වමි.

ඒ.ජගත් ඩී ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය